# රූප වේදනා සංඥා සංස්කාර විඥාන පිරිසිඳ දැකීම දුකෙන් මිදීමයි

## පරිඤ්ඤා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 3 - පිටු අංක 46 - 49)

පිරිසිඳ (සම්පූර්ණයෙන්) දත යුතු ධර්මයෝ කවරක් ද යත්;

- රූපය පිරිසිඳ දත යුතු ධර්මයකි.
- වේදනාව පිරිසිඳ දත යුතු ධර්මයකි.
- සංඥාව පිරිසිඳ දත යුතු ධර්මයකි.
- සංස්කාරය පිරිසිඳ දත යුතු ධර්මයකි.
- විඥානය පිරිසිඳ දත යුතු ධර්මයකි.

පිරිසිඳ දැකීම කවරක් ද යත්;

යම් රාගය ප්‍රහාණයක්, ද්වේෂය ප්‍රහාණයක්, මෝහය ප්‍රහාණයක් වේ ද මේ පිරිසිඳ දැකීම යැයි කියනු ලැබෙයි.